# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1810/23 – 2013 මැයි 14 වැනි අඟහරුවාදා – 2013.05.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: උප/03/ඉඅත්/පොදු/02.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්/ඩී/05/2009/ඩබ්එස්/63.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුකර පහළ කෝරළයේ ගම්පොලවත්ත ග්‍රාම නිලධාරී වසමේ ගම්පොලවත්ත ජනපදයේ පිහිටි සර්වෙයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැසි අංක 320021 හා 2012.08.16 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 90 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0016 ක් පමණ වන ගම්පොලවත්ත නමැති ඉඩම.

01. **කැබලි අංක 90**
ඉඩමේ නම: ගම්පොලවත්ත; හිමිකම් කියන අය: කෝරාල ගෙදර පොඩිමැණිකේ; ප්‍රමාණය: හෙක්. 0.0016.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජුනි 24 වැනි දින පෙ.ව. 10.00ට දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 ජුනි මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
දොළුව.

2013 අප්‍රේල් මස 29 වැනි දින,
දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 804

---

ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 4/7/45-11.
ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය: 03/ජේ/91/යූඩීජී/184.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්ති දැන්වීම ප්‍රකාර අංක 1151/28 හා 2000.09.29 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* දැන්වීම ප්‍රකාර 2000.10.27 දින සිදු කරන ලද හිමිකම් පරීක්ෂණය මත පදනම්ව නිකුත් කරන ලද පනතේ 10(1)අ වගන්ති දැන්වීමත් පසුව අ.ග.පි. බ/508 දරන පිඹුරේ අත්පත් කරගත් ඉඩමේ අයිතිවාසිකම් නිවැරදි ලෙස නිරූපනය නොවීමත්, මුල් ඉඩම් හිමිකරු මිය යැමත් නිසා පනතේ 10(1)ආ වගන්තිය යටතේ අධිකරණ තීරණයට යොමු කිරීමෙන් අනතුරුවද, ඉඩම් හිමියන්ට අපේක්ෂිත වන්දි මුදල් නිසි පරිදි නොලැබීමත්, පසුව වන්දි හිමිකරුවන් විසින් සිදුකරන ලද අභියාචනයට අනුව අර්ථ නිරූපණ ආඥාපනතේ 18 වන වගන්තිය යටතේ ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 9 වන වගන්ති හිමිකම් පරීක්ෂණය අවලංගු කර පනතේ 7 වන වගන්ති දැන්වීම පහත පරිදි සංශෝධනය කරන බව සියළු දෙනාට මෙයින් දැනුම් දෙමි.

බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොට්ඨාස අංක 10 බදුල්ල මධ්‍යම, (බදුල්ල මහ නගර සීමාව තුළ) කැඳලගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක බ/508 හා 1999.10.27 දිනැති පිඹුරෙහි අධිස්ථාපනය කරන ලද බදුල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ බ/508 හා 2013.04.10 දිනැති පිඹුරේ පෙන්නුම් කරන පහත විස්තර කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1449 ක්වූ ඉඩම් කැබලි 02.

**කැබලි අංක 02**

ඉඩමේ නම: පණ්ඩිතගෙදර වත්ත හා රදළවත්ත වරි. අංක 37, 39, 39/1, 39/2, 39/3, 39/4, 39/5, තැපැල් කන්තෝරුව පාර; විස්තරය: වත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0228.

**කැබලි අංක 03**

ඉඩමේ නම: පණ්ඩිතගෙදර වත්ත හා රදළවත්ත වරි. අංක 3ඒ, තැපැල් කන්තෝරුව පාර; විස්තරය: වත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.1221.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූනි මස 26 වැනි දින ප.ව. 2.30ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 ජූනි 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ගාමිණී මහින්දපාල ජෝපියස්,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2013 මැයි මස 03 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 805

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.